**පදවිය ප්‍රාදේශීය සභාව - 2022**

**-----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

පදවිය ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට පදවිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (l) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ කඩකාමර කුලී රු.22,000 ක් අඩුවෙන් දක්වා තිබුණි. | පිළිගන්නා බව. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ නල ජලය විකුණුම් රු.12,246 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් පරිත්‍යාග ලෙස ලද වටිනාකම රු.79,800 ක්වූ විදුරු අල්මාරිය,වත්කමක් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | -එම- | වත්කම් හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | 2021 වර්ෂයේ රු.484,859 ක වියදමින් ඉදිකළ වී ගබඩාව කුට්ටිගල් පාර ඉදිකිරීම් ව්‍යාපෘතිය දෙවරක් ගිණුම්ගත කර තිබුණි. | -එම- | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | ගම සමඟ පිළිසඳරක් වැඩ සටහනේ ප්‍රතිපාදන මත ඉදිකළ රු.6,970,589 ක වෙළඳකුටි 32 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ ආදායමේ හඳුනාගත් ප්‍රාග්ධන ප්‍රදාන රු.419,293 ක් වැඩියෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |
| (උ) | 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශයේ 2022 ජනවාරි 01 දිනට අතිරික්තයේ හා ඌණතාවය ඇතුලත් කර නොමැති ප්‍රාග්ධන දීමනා ආරම්භක ශේෂය රු.24,362,601ක් දක්වා නොතිබීම නිසා අවසන් ශේෂය එම වටිනාකමින් අඩුවී තිබුණි. | -එම- | -එම- |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම නිර්දේශය | නිර්දේශය |
|---|---|---|
| 2022 ජනවාරි 01 දිනට සමුච්චිත අරමුදල් ආරම්භක ශේෂය රු.367,860,684 ක් වුවත් ස්කන්ධය වෙනස්වීම ප්‍රකාශය අනුව එය රු.352,543,697 ක් වූයෙන් රු.15,316,987 ක වෙනසක් විය. | පිළිගන්නා බව. | උපලේඛන අනුරූපී වාර්තා සමඟ සැසඳිය යුතුය. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ගැලපුම් ශිර්ෂය යටතේ වර්ෂය සඳහා ගැලපුම් වටිනාකම රු.3,504,730 කුමක්ද යන්න පිළිබඳ ජ්නල් සටහන් ආදී සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි. | පිළිගන්නා බව. | තහවුරු කිරීම් ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | 2022 දෙසැම්බර් 31 දිනට ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශය පූර්ව කාලපරිච්ඡේදයේ වැරදි වටිනාකම රු.13,329,875 කුමක්ද යන්න පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වටිනාකම රු.228,670,000 ක් වූ ඉඩම් සම්බන්ධව උපලේඛනයක් ඉඩම් පැවරුම් වාර්තා, ඉඩම් මැනිම් තොරුතුරු සහ නෛතික ලේඛන ඉදිරිපත් නොවීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | -එම- | -එම- |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1. නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2015 ජුලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | භාවිතා කළ නොහැකි වාහන 06 ක් සම්බන්ධව අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | යාන්ත්‍රික ඉංජිනෙරුවරයෙකු පැමිණි වහාම මෙම කටයුතු සිදු කරන බව. | ක්‍රියාමාර්ග කඩිනම් කළ යුතුය. |
| (ආ) | උතුරු මැද පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2020 අගෝස්තු 22 දිනැති අංක NCP/LG/IF/04/04/2020 දරන ලිපිය | 2022 වර්ෂයේ J.C.B යන්ත්‍රය කුලියට දීම වෙනුවෙන් අයවිය යුතු රු.221,330 අයකරගෙන නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරන බව. | -එම- |

## 02 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ වියදම රු.5,023,369 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ වියදම රු.1,596,089 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් ,බිල්කළ ආදායම් ,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2022 ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31දිනට මුළු හිඟය | 2021 ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් බදු | 1,655,600 | 1,495,450 | 1,533,900 | 605,000 | 1,421,400 | 1,752,270 | 1,108,820 | 643,450 |
| (ii) | කුලී | 6,391,400 | 3,899,085 | 3,465,685 | 448,600 | 5,803,000 | 2,338,632 | 2,322,432 | 15,200 |
| (iii) | බලපත්‍ර ගාස්තු හා සේවා | 3,367,500 | 1,864,352 | 1,692,960 | 214,642 | 2,804,720 | 1,719,462 | 1,676,462 | 43,250 |
| (iv) | වෙනත් ආදායම් | 8,742,500 | 7,822,602 | 7,697,834 | 1,377,495 | 7,462,300 | 6,111,690 | 6,013,270 | 1,252,727 |
| | | 20,157,000 | 15,081,489 | 14,390,379 | 2,645,737 | 17,491,420 | 11,922,054 | 11,120,984 | 1,954,627 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| (i) | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ හඳුනා ගෙන ගැසට් නිවේදනය පළකර වරිපනම් බදු අය කිරීමට 2022 වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. | දේපල සමීක්ෂණ කටයුතු සිදුකරමින් පවතින බව. | ක්‍රියාමාර්ග කඩිනම් කළ යුතුය. |
| (ii) | සභා බල ප්‍රදේශයේ පිහිටි කසළ ලබාගන්නා ආයතන පිළිබඳව සමීක්ෂණයක් සිදුකර ඔවුන් සමඟ ගිවිසුම් අත්සන් කර ගාස්තු අය කිරීමට කටයුතු කර නොතිබුණි. | ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කර ඇති බව. | සමීක්ෂණයක් සිදුර ගාස්තු අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (iii) | 2022 දෙසැම්බර් 31 දිනට හිඟහිටි කර්මාන්ත බදු රු.115,000ක් හා ව්‍යාපාර බදු රු.490,070 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නව තක්සේරුවක් ලබා ගැනීමට ක්‍රියාකරන බව. | ක්‍රියාමාර්ග කඩිනම් කළ යුතුය. |
| **(ආ)** | **කුලී** | | |
| | ජංගම කඩ කාමර 23 ක් වෙනුවෙන් අයවිය යුතු කුලී රු.37,000 ක් මාස 01-06 දක්වා පරාසයක සිට අයවී නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරන බව. | අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |

**(ඇ) බලපත්‍ර ගාස්තු**

| | | | |
|---|---|---|---|
| (i) | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ව්‍යාපාර බදු, කර්මාන්ත බදු සහ වෙළඳ බලපත්‍ර සම්බන්ධව 2022 වර්ෂයේදී සමීක්ෂණයක් සිදුකර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෙර වර්ෂවලට අදාළ හිඟ ගාස්තු රු.900,100 ක් වූ අතර වර්ෂයේ හිඟය රු.61,850 ක් විය. | සමීක්ෂණයක් සිදු කර අය කර ගැනීමට කටයුතු කරන බව. | -එම- |
| (ii) | සභා බල ප්‍රදේශයේ පිහිටි වෙළඳ දැන්වීම් පුවරු පිළිබඳව 2021 සහ 2022 වර්ෂවලදී සමීක්ෂණයක් සිදුකර නොතිබුණු අතර දැන්වීම් පුවරු 109 ක් වෙනුවෙන් අයකළ යුතු හිඟ දැන්වීම් පුවරු ගාස්තු රු.813,050 ක් ද විය. | ආදායම් පරීක්ෂක නිලධාරියා විසින් සමීක්ෂණ විස්තර විෂයභාර නිලධාරීන් වෙත භාරදී නොතිබූ බව. | විෂයභාර නිලධාරියා දැනුවත් කළ යුතුය. |

(ඇ) **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2022 වර්ෂය සඳහා ලැබිය යුතු උසාවි දඩ රු.789,495 ක් සහ මුද්දර ගාස්තු රු.588,000 ක් වූ අයකර ගෙන නොතිබුණි. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | ගෙන්වා ගැනීම කඩිනම් කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**
**පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාව වෙත පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු හා සභාව විසින් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු වසර 01 ත් 07 ත් අතර කාලයක සිට පැවත එන රු.11,181,833 ක ශේෂයක් පැවති නමුත් එම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභා බල ප්‍රදේශයේ අත්‍යවශ්‍ය ස්ථානවල ස්ථාපිත කිරීම සඳහා මිලදී ගෙන තිබුණු වටිනාකම රු.2,685,900 ක්වූ විදී පහන් කට්ටල 54 ක් සහ සූර්ය විදී ලාම්පු කට්ටල 50 ක් සවි නොකර සභා කාර්යාලයේ රඳවා තබාගෙන තිබුණි. | -එම- | කඩිනමින් සවිකර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ප්‍රාදේශීය සභාව අයත් පරාක්‍රමපුර මහජන ක්‍රීඩාංගනයේ 2022 ජුලි 13 දින සිට ජුලි 23 දින දක්වා පැවැති ඇසළ කලාපය වෙනුවෙන් නිකුත් කරන ලද ප්‍රවේශපත්‍ර වෙනුවෙන් විනෝද බදු අය කර නොතිබුණි. | විනෝද කටයුතු වෙනුවෙන් ප්‍රවේශ පත්‍රයක් නිකුත් නොකළ බැවින් විනෝද බදු අයකර ගෙන නොමැති බව. | විනෝද අයිතම සඳහා සහභාගීවීම වෙනුවෙන් ප්‍රවේශ පත්‍රයක් නිකුත් කර තිබුණු බැවින් එම ආදායම් පදනම් කරගෙන විනෝද බදු අයකර ගත යුතුය. |

## 3.2 වත්කම් කළමනාකරණය

| **විගණන නිරීක්ෂණය** | **සභාවේඅදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය මණ්ඩලය විසින් වාහන 05 ක් වෙන්දේසි කර විකිණීමට නිර්දේශ කර තිබුණු නමුත් එය සිදුකර නොතිබුණි. | යාන්ත්‍රික ඉංජිනේරු පැමිණි වහාම මෙම කටයුතු සිදු කරන බව. | ක්‍රියාමාර්ග කඩිනම් කළ යුතුය. |